
# සැලී මගේ වීරයා



සඳිති වීරසේකර

# සැලී මගේ වීරයා

සඳිති වීරසේකර
කතෘ

කර්තෘගේ වෙනත් කෘති

නත්තල් තෑග්ග - 2025
පුංචි සමනලී - 2025
මල් කුමරිගේ මල් වත්ත - 2023

මහ/මාහාමායා බාලිකා විද්‍යාලය
මහනුවර
4 ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය - 2026 මැයි
ISBN 978-624-211-398-2

පිදුම

පුංචි අපට හොඳ නරක සහ අකුරු
කියා දෙන විදුහල්පතිතුමියට සහ
පන්ති භාර ගුරුතුමියට
බැති සිතින් පිළිගන්වමි.

## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලාවට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළිදැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.
අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.
මෙම ග්‍රන්ථ කරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබා දෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.
මෙම සාර්ථක කටයුත්ත සඳහා කැප වූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී. එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය.
2026-05-10

## සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමුකිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැප වූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.
ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහිකිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථ කරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

ඉරිදා දවසක මම මගේ පවුලේ අයත් එක්ක ගමනක් ගියා.

ඒ කොහෙද කියලා දන්නවද?

අපි ගියේ පේරාදෙණිය මල් වත්ත බලන්න.

එහෙදී අපි හරිම විනෝදෙන් හිටියා.

කෑම කෑවා.

බීම බිව්වා.

සෙල්ලම් කළා.



මහන්සි වී හිටිය අපි ගෙදර යන්න හදනකොටම මහා වැස්සක් වැස්සා.

මම කාර් එකට නගින්න හදන කොට කවුදෝ කෙඳිරි ගාන සද්දයක් ඇහුණා.

ඒක ඇහුණේ එතන තිබුණු ගහ පිටිපස්සෙන්.

මම එතනට ගිහින් බලනකොට හරිම හුරතල් බලු පැටියෙක් එතන හිටියා.




හැබැයි එයා හොඳටම තෙමිලා, තුවාල වෙලා, මඩ ගෑවිලා හිටියේ.

ඉතින් මම පවුලේ අනිත් අයටත් මේ ගැන කිව්වා.

අම්මා කුඩයකුයි, තුවායකුයි ගෙනාවා.

අක්කා අපි ගෙදර යන ගමන් කන්න හිටිය යෝගට් ගෙනාවා.

අප්පච්චි උණු වතුරයි, භාජනයකුයි ගෙනාවා.



බලු පැටියාව අපි තුවායෙන් පිහදාලා යෝගට් කන්න දීලා, උණු වතුරත් බොන්න දීලා අපේ කාර් එකට දාගත්තා.

අපි ගෙදරට යනකොට වැස්ස පායලා.

ගෙදර ගිහින් බලු පැටියාගේ තුවාල වලට බෙහෙත් දැම්මා.

ටික දවසක් යද්දී තුවාල හොඳ උනා.

ඔයාලා දන්නවා ද?

අපි බලු පැටියාට දැම්ම නම මොකක්ද කියලා.

අපි එයාට දැම්මේ සැලී කියලා.

අප්පච්චි මාමා කෙනෙක් ගෙන්වා බලු පැටියාට ලස්සන පොඩි කූඩුවක් සාදා දුන්නා.

මම අම්මා එක්ක කඩේට ගිහින් කෑම කන්න පිඟානක්, වතුර බොන්න පිඟානක් සහ බල්ලන්ට සාදා තිබෙන කෑම පැකට් මිල දී ගත්තා.


pet
food
Pet

එක දවසක් හරි පුදුම දෙයක් වුණා.

අපේ ගෙදර පිටිපස්සෙ ලොකු පස් කන්දක් තිබුණා.

එක සෙනසුරාදා දවසක මහ හයියෙන් වැස්සක් වැස්සා.

මම එළියට ගියා මගේ සපත්තු දෙක ගන්න.

එතකොටම සැලී බුර බුරා මාව ගේ ඇතුලට තල්ලු කළා.

ඒ නිසා මම ගේ ඇතුලට ගිහින් දොර වහගත්තා.

එක පාරටම ලොකු පස් කන්දක් සැලීව යට කරගෙන නාය ගිහින්.

මම ඒ ගැන දන්නේ නෑ.



හවස් වෙද්දි වැස්ස පායලා නිසා මම සැලීව හෙව්වා.

මම ගෙදර පිටිපස්සට සැලීව හොයන්න යද්දි තමයි දැක්කේ පස් කන්ද නාය ගිහින් කියලා.

මම දැක්කා පුංචි නැට්ටක් පස්වලට යටින් තියෙනවා.

මම එතනට ගිහින් බලද්දි සැලී පස්වලට යටවෙලා.

මම අඬාගෙන ගිහින් අම්මාට කිව්වා.

අම්මා ඉක්මනට ගිහින් අප්පච්චිට කිව්වා.

අප්පච්චී පස් අයින් කරලා සැලීව අරගෙන සත්ව රෝහලට ගෙන ගියා.

දොස්තර මාමා කිව්වාලු සැලීව බේරාගන්න අමාරුයි කියලා.

මට එදා හරිම දුකයි.

දවස් පහක් ගත වුණා.



පස්වෙනි දවසෙ තමයි මගේ උපන් දිනය තිබුණේ.

මගේ උපන් දිනයට අප්පච්චී ලොකු තෑගි පෙට්ටියක් ගෙනාවා.

මම ඒ තෑගි පෙට්ටිය ඇරලා බලද්දී මගේ ඇස්වලට කඳුළු පිරුණා.

ඒ පෙට්ටිය ඇතුලෙ හිටියේ සැලී.

මගේ ජීවිතය බේරා ගත්ත නිසා මම එදා ඉඳන් සැලීට කතා කළේ “වීර සැලී” කියලයි.

එදා ඉඳන් වීර සැලීව මම වෙනදාටත් වඩා හොඳින් රැකබලා ගත්තා.



# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දයාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් "හේමමාලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මුලික අරමුණයි.

ව්‍යූහල්පතිනිය, මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලූ ශ්‍රී දළද මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාරිය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)